(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 16]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 අගෝස්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0046/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට සේවක භාරකාර අරමුදලේ සමස්ත වටිනාකම කොපමණද;

(ii) 2004, 2005 සහ 2006 යන වර්ෂවල දෙසැම්බර් මස 31 වැනි දිනට එම අරමුදලෙහි වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම අවස්ථාව වන විට පවත්වාගෙන යනු ලබන සේවක භාරකාර අරමුදලේ තනි පුද්ගල සාමාජික ලිපිගොනු සංඛ්‍යාව කොපමණද; සහ

(iv) පසුගිය අවුරුදු දෙක තුළ ගෙවන ලද පොලී අනුපාතයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සේවක භාරකාර අරමුදලෙන් එකතු කරගනු ලබන මුදල් ආයෝජනය කරනු ලබන්නේ කවර ආයතනයන්හිද;

(ii) රජයේ සමාගම්, රජයේ ආයතන හෝ රජයට සම්බන්ධ ආයතනයන්හී යම් ආයෝජනයන් සිදු කරනු ලැබ තිබේද; සහ

(iii) ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබ තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය වසර තුළ සිදු කරන ලද ආයෝජන පිළිබඳ වාර්තාවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) (i) කොටස් වෙළෙඳ පොළේ ලියාපදිංචි වී නොමැති සමාගම්වල යම් ආයෝජනයන් සිදු කරනු ලැබ තිබේද; සහ

(ii) භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද ආයෝජන හැරුණුකොට ආයතනවල කරන ලද ආයෝජන වෙනුවෙන් ලබා ගන්නා ලද ලාභාංශ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0047/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 ජුලි මස මාවිල්ආරු හී ගොවීන් මුහුණදුන් ගැටළුවට හේතුව කවරේද;

(ii) මෙම ගැටුමේදී තක්සේරු කරන ලද ඉඩම් ප්‍රමාණය සමග විපතට පත් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගොවීන්ට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ගොවීන් නොවන අයට යම් ගෙවීමක් සිදුකර තිබේද; සහ

(iii) එසේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගොවීන් නොවන අයට චෙක්පත්, මුදල් හෝ බැංකු අණකර මගින් වන්දි ගෙවනු ලැබුවේද;

(ii) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0049/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1997 වසරේ සිට 2007 ජුලි මස 31 වැනි දින දක්වා භාණ්ඩාගාරය විසින් සීමාසහිත ලංකා හොටෙල් ඩිවෙලොපර්ස් (එච්. ඩී. එල්. ) ආයතනයට ලබා දුන් ණය ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම (එච්. ඩී. එල්.) ආයතනයට, ලබා දුන් එක් එක් ණය සම්බන්ධයෙන් වන කොන්දේසි හා නියමයන් දක්වමින් භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ලිපි එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) 2007 ජුලි මස 31 වැනි දින වන විට එක් එක් ණය වෙනුවෙන් ගෙවිය යුතු ප්‍රාග්ධනය හා පොලිය කොපමණද;

(ii) ගෙවීම පැහැර හරින ලද ණය වෙනුවෙන්, එච්. ඩී. එල්. ආයතනය විසින් 2007 ජුලි මස 31 වැනි දින දක්වා වන විට ගෙවා ඇති මුදල කොපමණද; හා

(iii) රජය විසින් එච්. ඩී. එල්. ආයතනයට ලබා දීමට ඇති ණය ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එච්. ඩී. එල් ට අයත් හිල්ටන් හෝටලය පිහිටා ඇති ඉඩමේ වටිනාකම රහිතව, හිල්ටන් හෝටලයේ වටිනාකම ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද පරිදි කොපමණද;

(ii) හිල්ටන් හෝටලයේ වටිනාකම ඉක්මවන රජයට ගෙවිය යුතු ණය ප්‍රමාණය කොපමණද;

(iii) 1997 වසරේ සිට එච්. ඩී. එල්. ආයතනය විසින් ගෙවීම පැහැර හැර ඇති ණය ආපසු අයකර ගැනීම තාවකාලිකව නතර කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණේද;

(iv) එම සහනය අනෙකුත් හෝටල් සඳහා ලබා දෙන්නේද;

(v) නොඑසේ නම්, ඊට හේතුව කුමක්ද; හා

(vi) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මීට අදාළ නිවැරදි තත්ත්වය පාර්ලිමේන්තුවට දැනුම් නොදීමට හේතුව කුමක්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0134/’08

4.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 මැතිවරණයෙන් රජය බලයට පත්වීමට පෙර කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 මැතිවරණයෙන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත රජය බලයට පත්වීමෙන් පසු ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා හිමිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0135/'08

5.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 මැතිවරණයෙන් රජය බලයට පත්වීමට පෙර කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 මැතිවරණයෙන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත රජය බලයට පත්වීමෙන් පසු ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා හිමිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0136/'08

6.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2004 මැතිවරණයෙන් රජය බලයට පත්වීමට පෙර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පැවති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 මැතිවරණයෙන් රජය බලයට පත්වීමෙන් පසු මේ වන විට කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති,

(i) රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත රජය බලයට පත්වීමෙන් පසු ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා හිමිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0172/'08

7.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) රාජ්‍ය අනුග්‍රහය ඇතිව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාතලේ හන්දිය, කුරුන්දන්කුලමේ සී/ස ජනතා ලංකා මිරිස් සමාගම නමින් සමාගමක් පිහිට වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේනම් එම සමාගමේ සභාපතිවරයා කවුරුන්ද;

(ii) අධ්‍යක්ෂ මණ්ඩලයක් හෝ නිලධාරි මණ්ඩලයක් පත්වූයේ නම්, ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) සමාගම පිහිටුවීම සඳහා උතුරු මැද පළාත් සභාවේ හෝ රජයේ මුදල් හෝ සම්පත් යෙදවූයේද;

(iv) එසේනම් මුදල් යෙදූ ආයතන හා මුදල් ප්‍රමාණය කොපමණද;

(v) වෙනත් පහසුකම් සැලසුවේ නම් ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම සමාගමට ගොවීන් සාමාජිකයින් ලෙස බඳවා ගත්තේද;

(ii) එසේනම් ඔවුන්ගේ නම්, ලිපිනයන්, කොටස් මුදල, සාමාජික මුදල හෝ එලෙස එකතු කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) සාමාජික මුදල් යෙදවූයේ කවර කටයුත්තක් සඳහා ද;

(iv) සාමාජික කොටස් මුදල් ආපසු ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඈ) (i) අතහැර දමා තිබූ මෙම සමාගම නැවත ආරම්භ කළේ නම් ඒ කවදාද;

(ii) ඒ සඳහා ගමනැගුම ව්‍යාපෘතිය මගින් මුදල් වෙන්කර තිබේනම්, අදාළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0173/'08

8.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටට අවශ්‍ය බඩ ඉරිඟු වලින් කොපමණ ප්‍රමාණයක් මෙරට නිෂ්පාදනය කරන්නේද;

(ii) 1987 සිට 2007 දක්වා ඒ ඒ වර්ෂය තුළ කොපමණ බඩ ඉරිඟු ප්‍රමාණයක් නිෂ්පාදනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහි ද?

(ආ) (i) බඩ ඉරිඟු නිෂ්පාදනයට අවශ්‍ය බීජ නිෂ්පාදනය කිරීම සඳහා තිබෙන රජයේ ගොවිපලවල් සංඛ්‍යාව හා එම ගොවිපලවල් කවරේද ;

(ii) මෙම එක් එක් ගොවිපල මගින් 1987 සිට 2007 දක්වා කාලය තුළදී කොපමණ බඩ ඉරිඟු බීජ ප්‍රමාණයක් වාර්ෂිකව නිපදවන ලද්දේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) ගුණාත්මක බඩ ඉරිඟු බීජ නොලැබීමෙන් බඩ ඉරිඟු වගාව කරන ගොවි ජනතාව අපහසුතාවයට පත්ව ඇති බව එතුමා පිළිගන්නෙහි ද?

(ඈ) බඩ ඉරිඟු වගාව බිඳවැටී ඇත්නම්, බඩ ඉරිඟු වගාව වැඩිදියුණු කිරීම සඳහා කවර ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0174/'08

9.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටට අවශ්‍ය වියලි මිරිස් වලින් කොපමණ ප්‍රමාණයක් මෙරට නිෂ්පාදනය කරන්නේද;

(ii) 1987 සිට 2007 දක්වා ඒ ඒ වර්ෂය තුළ කොපමණ වියලි මිරිස් ප්‍රමාණයක් නිෂ්පාදනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහි ද?

(ආ) (i) වියලි මිරිස් නිෂ්පාදනයට අවශ්‍ය බීජ නිෂ්පාදනය කිරීම සඳහා තිබෙන රජයේ ගොවිපලවල් සංඛ්‍යාව හා එම ගොවිපලවල් කවරේද;

(ii) මෙම එක් එක් ගොවිපල මගින් 1987 සිට 2007 දක්වා කාලය තුළදී කොපමණ වියලි මිරිස් බීජ ප්‍රමාණයක් වාර්ෂිකව නිපදවන ලද්දේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) ගුණාත්මක වියලි මිරිස් බීජ නොලැබීමෙන් මිරිස් වගාව කරන ගොවි ජනතාව අපහසුතාවයට පත්ව ඇති බව එතුමා පිළිගන්නෙහි ද?

(ඇ) වියලි මිරිස් වගාව බිඳවැටී ඇත්නම් වියලි මිරිස් වගාව වැඩිදියුණු කිරීම සඳහා කවර ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0301/'08

10.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වෙහෙරගල කොට්ඨාසයේ රුහුණුගම ඒකකයේ අංක 125 දරන ඉඩමේ වර්ෂ 10ක පමණ කාලයක සිට එල්. කේ. නිමල් නමැති අයෙකු දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ස්ථිරව පදිංචිවී සිටින බවත්;

(ii) මෙම ගොඩනැගිල්ලට විදුලිය ලබා ගැනීම සඳහා වෙහෙරගල කොට්ඨාස කළමනාකරු විසින් අයිතිය තහවුරු කර විදුලි බල මණ්ඩලයට ලිපියක් ලබා දී ඇති බවත්;

(iii) මොවුන්ගේ නම් මැතිවරණ නාමාවලියට ඇතුළත්ව ඇති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) (i) මෙම ඉඩම සහ ගොඩනැගිල්ල ආපසු මහවැලි අධිකාරියට පවරා ගැනීම සඳහා, පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 44/149/06 දරන නඩුව පවරා ඇත්තේ හුදෙක් දේශපාලන පළිගැනීමක් ලෙස බවත්;

(ii) 2004 මහ මැතිවරණයේදී මහවැලි ආරක්ෂක නිලධාරීන් විසින් මොහුගේ නිවසට වෙඩි තබා පලාගිය බවත්;

(iii) මේ පිළිබඳව අරලගන්විල පොලිසියේ පැමිණිල්ලක් කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මොහුගේ මෙම ඉඩම වටා ඇති අනෙකුත් සියලුම ඉඩම් මුල් ඉඩම්ලාභීන්ගෙන් පවරාගෙන භුක්ති විඳින ඒවා වන අතර, එම ඉඩම් සම්බන්ධයෙන් මෙවැනි කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත්තේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නිමල් මහතාට තවදුරටත් ඔහුගේ නිවස හා ඉඩම භුක්ති විඳීමට අවශ්‍ය කටයුතු සලසන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0535/'08

11.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජාතික අධ්‍යාපන ආයතනය සඳහා පසුගිය වසර 5 තුළ රජය මගින් වෙන් කරන ලද පුනරාවර්තන හා මූලධන වියදම වෙන් වෙන්ව කොපමණද;

(ii) එම වර්ෂයන් සඳහා වෙන් කරන ලද මූලධන වියදම්වල වැය විෂයයන් කවරේද; සහ

(iii) අදාළ වර්ෂ තුළ මූල්‍ය ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ආයතනයට වෙනත් සංවිධාන (ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ආදී) හා ආයතන හරහා අදාළ වර්ෂයන් තුළ ලබා දෙන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම ආයතන මගින් මුදල් ලබා දෙන ලද්දේ කවර ව්‍යාපෘති සඳහාද; සහ

(iii) එම ව්‍යාපෘතිවල අරමුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0602/'08

12.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1574 දරන පහළ ලබ්බල ග්‍රාම නිලධාරී වසමේ පැණිවෙරළුව ගමෙහි 2004 ඡන්ද හිමි නාමලේඛනයේ ගෘහ මූලික අංක 430/76/01 හි පදිංචි තැන්නෙගෙදර උපුල් ප්‍රියන්ත රන්වල මහතා ඇතුළු පවුලේ සාමාජිකයන් ගෘහමූලික අංක 430/176 හිද, ගෘහ මූලික අංක 430/129 හි පදිංචි අබේසිංහ මුදියන්සේලාගේ සෙනෙවිරත්න මහතා ඇතුළු පවුලේ සාමාජිකයන් 430/243 හි ද, ගෘහ මූලික අංක 430/232 හි පදිංචි නිපුනච්චාරී ගණිතයලාගේ ප්‍රේම රංජිත් මහතා ගෘහ මූලික අංක 430/165 හි ද, ගෘහ මූලික අංක 930/217 හි ජයසිංහ ආරච්චිලාගේ දිනේෂ් ප්‍රිය සුරංග මහතා ගෘහ මූලික අංක 430/63/01 හි ද, ද්විත්ව ලියාපදිංචිය ඇති අය බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එමගින් එකම පුද්ගලයෙකුට අවස්ථා දෙකකදී, ඡන්දය පාවිච්චි කිරීමට හැකි බවත්;

(ii) එම හේතුවෙන් දේශපාලන පක්ෂ කිහිපයකට හෝ අපේක්ෂකයෙකුට යම් අසාධාරණයක් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මේ සම්බන්ධයෙන් කරන ලද පැමිණිලිවලට විමර්ශනයක් සිදු කළේද;

(ii) විමර්ශනයේදී වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන තිබේද;

(iii) එසේ හඳුනාගෙන තිබේනම්, එම නිලධාරීන්ට එරෙහිව ගනු ලැබූ විනය ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඉදිරියේදී මෙම වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0628/'08

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු අධිකාරිය, අර්ධ රාජ්‍ය, ලාභ නොලබන හා පූර්ණ වශයෙන් රාජ්‍ය මුදලින් නඩත්තු වන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණනයන්ට යටත්ව පවත්වාගෙන යන ආයතනයක් බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ආයතනයේ දැනට ක්‍රියාත්මක වන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2005 යටතේ නියමිත ප්‍රසූති නිවාඩු නොව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2004 යටතේ නියමිත ප්‍රසූති නිවාඩු පමණක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත 4/2005 චක්‍රලේඛය මගින් අවලංගු කළ 3/2004 චක්‍රලේඛය තවදුරටත් මෙම ආයතනය සඳහා අදාළ වන්නේ කෙසේද;

(ii) මෙය කවර අයකුගේ නියෝගයක් ද;

(iii) එම අයට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වෙනස් කළ හැක්කේ කෙසේද;

(iv) ඒ සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අවසරය ලබා ගත්තේ නම්, ඒ කවදාද;

(v) නොඑසේ නම්, මෙය එක් නිලධාරියෙක් විසින් අමාත්‍යාංශයට නොදන්වා ගනු ලැබූ තීරණයක්ද;

(vi) මෙය අමාත්‍යාංශ නියෝගයක් නම්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2005 පමණක් අදාළ නොවී, අනෙකුත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ වන්නේ කෙසේද;

(vii) ඉදිරි කාලයේ දී 4/2005 චක්‍රලේඛයේ පරිදි ප්‍රසූති නිවාඩු අදාළ නිලධාරිනියන්ට ලබා දෙන්නේද;

(viii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(ix) අදාළ ප්‍රසූති නිවාඩු නොලැබූ නිලධාරිනියන්ට ලැබෙන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0666/'08

14\.

ගරු සමන්සිරි හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කොළඑලිය වැවට සහ වැව් රක්ෂිතයට අයත් මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මෙමගින් අස්වද්දන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1984 වර්ෂයේ කොළඑලිය වැව ප්‍රතිසංස්කරණය කිරීමට පෙර වැව් පත්ලට යටවන බවට හඳුනාගත් වගුරු බිම් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ඉඩම්වල හිමිකරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එලෙස හඳුනාගත් අයට වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට පෙර නීත්‍යානුකූලව විකල්ප ඉඩම් ලබාදීමට කටයුතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) එලෙස විකල්ප ඉඩම් හිමි වූ අයගේ නාමලේඛනය, ලබාදුන් මුළු ඉඩම් ප්‍රමාණය, දිනය, සහ ඒ සඳහා සහභාගී වූ ආයතන නිලධාරීන්ගේ නම් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) විකල්ප ඉඩම් ලබා දුන් පසුවද, වැව් පත්ලට යටවන වගුරුබිම් සඳහා හිමිකම් ඇති කිහිපදෙනෙක් ඉන් ඉවත් කිරීමට මෙතෙක් නීත්‍යානුකූලව කටයුතු කර නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) (i) විකල්ප ඉඩම් ලබාදී තිබියදීත් මොවුන් ඉවත් නොකිරීමට හේතු කවරේද;

(ii) මෙම ඉඩම්වල නීත්‍යානුකූල නොවන අයුරින් ඉදිකිරීම්, විදුලි රැහැන් ඇදීම් සිදුවූයේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(උ) නොඑසේ නම්, ඒ මන්ද?

0668/'08

15.

ගරු සමන්සිරි හේරත් මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හලාවත, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්වාගෙන යනු ලබන ඉන්දියානු සමාගමකට අයත් "බුවල්කා" නමින් හඳුන්වනු ලබන යකඩ උණු කරන කර්මාන්ත ශාලාවේ යකඩ නිෂ්පාදනයේ දී ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඒ සඳහා පරිසර ඇගයීම් තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අපද්‍රව්‍ය මිශ්‍රවීමෙන් අවට ප්‍රදේශයේ ළිං වලට හා භූ ගත ජලයට හානි සිදුවන බවත්;

(ii) මෙම කම්හලෙන් පිටවන දූම්රොටු අවට පරිසරයේ කිලෝමීටර් 4-5ක් පමණ පැතිර යන බවත්;

(iii) එය ජනතාවගේ ස්වසන රෝග වැඩිවීමට හේතුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) අදාළ කම්හලෙන් දූම්රොටු පිටවීම පාලනය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය මගින් පාලනාධිකාරිය වෙත ලබාදුන් නියෝග කවරේද;

(ii) ඒ අනුව කර්මාන්ත ශාලාවේ කටයුතු නිරීක්ෂණය කර තිබේද;

(iii) එසේ නම් ඒ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) මේ වනවිට අදාළ කර්මාන්ත ශාලාවෙන් සිදුවන විශාල පරිසර හානිය වැළැක්වීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු අර්ජුන රණතුංග මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය.

“ වාරියපොල රාජමහා විහාර සංවර්ධන සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

2.

ගරු අර්ජුන රණතුංග මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය.

“ රතු පියුම (ජාත්‍යන්තර) ශ්‍රී ලංකා සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 142,— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දහ අටකට (රු. 18,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 142 | — | සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය | | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන වැඩසටහන | | |
| ව්‍යාපෘතිය | 3 | — | සමාජ සංස්කෘතික ඒකාබද්ධව කටයුතු කිරීම | | |
| | | | පුනරාවර්තන වියදම් | රු. | 18,000,000 |
| | | | මුළු වියදම | රු. | 18,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජුලි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 3 දක්වා එකතුව රුපියල් 3,198,180,332.

*3.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,—පරිපූරක මුදල — ශීර්ෂය 118,— වැඩසටහන 02,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළහැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් එක්දහස් එකසිය අසූපන් කෝටි හතලිස් ලක්ෂයකට (රු.1,185,40,00,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 118 | — | කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන වැඩසටහන |
| ව්‍යාපෘතිය | 03 | — | කෘෂිකාර්මික සංවර්ධනය |
| පුනරාවර්තන වියදම් | | | රු. 1,185,40,00,000 |
| මුළු වියදම | | | රු. 1,185,40,00,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

†2008 ජූලි මස 25 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 5 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 4 දක්වා එකතුව රුපියල් 3,216,180,332.

*4.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*8.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*11.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*12.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*13.

සුදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*14.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*15.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 27 වැනි දින අංක 1555/32 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*18.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියමය,— 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජනවාරි මස 25 වැනි දින අංක 1533/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*19.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ සහ 23 ආ වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 32 වැනි වගන්තිය යටතේ පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 01 වැනි දින අංක 1534/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*20.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 වැනි දින අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද “2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග” අනුමත කළ යුතු ය.

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 වැනි දින අංක 1544/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*22.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 වැනි දින අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*23.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 වැනි දින අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය හා දීමනාව, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| දීමනාව | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 80,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. 12,000.00 | මාසික |
| | එකතුව | රු. 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනාව සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14,400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2004,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2006. 07. 21 වැනි දින ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ 2004 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(නිවාස සහ ඉදිකිරීම් පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

*31.

ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව 2005,— 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය යටතේ 2006.11.24 වැනි දින ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2005 වර්ෂයේ වාර්ෂික වාර්තාව, අවසාන ගිණුම සහ විගණකාධිපතිගේ වාර්තාව අනුමත කළ යුතු ය.

(ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී)

32.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

33.

උතුර සහ  නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.

මහවැලි සංස්කෘතික පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.

රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.

කොළොන්නාව තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1] " පනත් කෙටුම්පත  දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.